// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2029/30 - 2017 ජූලි මස 26 වැනි බදාදා - 2017.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත

2 වන වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම් කොටස, ඇහැලියගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ, බස්නැවතුම්පල පුනස්ථාපනය කිරීම සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 ජූලි මස 25 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පල්ලේපත්තුව සුළු කොට්ඨාසයේ කැන්දගමුව ගමේ පිහිටියා වූ ද මිනින්දෝරු අධිකාරී විසින් 2016.06.17 වන දින මැන පිළියෙල කරන ලද ප්‍රගමන අනුරේඛන අංක R/EHL/2015/994 හි කැබලි අංක A වලින් නිරූපිත ප්‍රමාණයෙන් අක්කර 01 රූඩ් 00 පර්චස් 12.01 ක් පමණ විශාල වූ ඉඩමට අදාළ මායිම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| උතුරට | - | ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා භූමිය සහ ර/ඇහැලියගොඩ මධ්‍ය මහා විද්‍යාලය පිහිටි පුස්සැල්ලගෙහේනේ වත්ත ; |
| නැගෙනහිරට | - | ර/ඇහැලියගොඩ මධ්‍ය මහා විද්‍යාලය පිහිටි පුස්සැල්ලගෙහේනේ වත්ත සහ කැබලි අංක B ; |
| දකුණට | - | කැබලි අංක B, එල්. ආර්. ධර්මසිරි සහ තවත් අය හිමිකම් කියන පුස්සැල්ලගෙහේනේ දෙනිය සහ මාර්ග (මා.සං.අ) ; |
| බටහිරට | - | එල්. ආර්. ධර්මසිරි සහ තවත් අය හිමිකම් කියන පුස්සැල්ලගෙහේනේ දෙනිය, මාර්ග (මා.සං.අ) සහ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා භූමිය පිහිටි පුස්සැල්ලගෙහේනේ වත්ත. |

08 - 369

1A - G 25970 — 17 (2017/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*